
භූගෝල විද්‍යාව
9 ශ්‍රේණිය

# භූගෝල විද්‍යාව - 9 ශ්‍රේණිය

# ආසියාවේ මානුෂ භූ දර්ශනය

## ආසියාවේ පැරණි මානව ශිෂ්ටාචාර

- යුප්‍රටීස් ටයිග්‍රිස් ගංගා නිම්න ආශ්‍රිත මෙසපොටේමියානු ශිෂ්ටාචාරය
- ඉන්දු ගංගා නිම්නය ආශ්‍රිත මොහෙන්ජොදාරෝ සහ හරප්පා ශිෂ්ටාචාර
- හොවැංහෝ ගංගා නිම්නය ආශ්‍රිත අන්යාන් නගරය මුල් කරගත් ශිෂ්ටාචාරය

ක්‍රමවත් නගර නිර්මාණ, ගොඩනැගිලි හා ප්‍රතිමා නිර්මාණය, කෘෂිකර්මාන්තය, කලාත්මක භාණ්ඩ නිර්මාණය මෙම ශිෂ්ටාචාරවල දියුණුව පැවති විශේෂ ලක්ෂණ වේ.








# ආසියාවේ මානව වර්ග

ආසියානු කලාපයේ ජීවත් වන මානව වර්ග ප්‍රධාන වශයෙන් දෙකක් දක්නට ලැබේ.



## මොංගොලොයිඩ් මානව වර්ගය

ජීවත් වන රටවල්

- චීනය
- ජපානය
- මලයාසියාව
- කොරියාව
- සිංගප්පූරුව



## කොකසොයිඩ් මානව වර්ගය

ජීවත් වන රටවල්

- ඉන්දියාව
- ඇෆ්ගනිස්ථානය
- පාකිස්ථානය
- ශ්‍රී ලංකාව
- අරාබි රටවල්

# ආසියාවේ ජන ව්‍යාප්තිය

ආසියාවේ ජනගහනයෙන් අඩකටත් වඩා ජීවත් වන්නේ චීනය සහ ඉන්දියාව යන රටවල් දෙකෙහි ය.

## අසම ජන ව්‍යාප්තියට බලපාන භෞතික සාධක

- භූ විෂමතාවය
- දේශගුණය
- ජලවහනය
- පස

දකුණු ආසියාව, අග්නිදිග ආසියාව හා නැගෙනහිර ආසියාවේ ගංගා නිම්න ආශ්‍රිතව වර්ග කිලෝමීටරයට 500 ට අධික ජන ඝණත්වයක් ඇත.

උදා-:
- උතුරු ඉන්දියාවේ ඉන්දු ගංගා තැන්න ආශ්‍රිත කලාපය.
- මියන්මාරයේ ඉරවඩී ගංගා නිම්නය ආශ්‍රිත කලාපය
- චීනයේ හොවැංහෝ ගංගා නිම්නය ආශ්‍රිත කලාපය

## ආසියාවේ ජන හීන ප්‍රදේශ

- මධ්‍යම ආසියාව
- මොංගෝලියාව
- උතුරු දිග තැනිබිම් ප්‍රදේශ
- ගෝබී සහ ථාර් කාන්තාර ප්‍රදේශ


පිළිතුරු සපයන්න.
1. ආසියාවේ පිහිටි පැරණි මානව ශිෂ්ටාචාර මොනවාද?
2. ආසියානු කලාපයේ ප්‍රධාන වශයෙන් දැකිය හැකි මානව වර්ග නම් කරන්න.
3. එම මානව වර්ග ජීවත්වන රටවල් වෙන වෙනම නම් කරන්න.
4. ජන ව්‍යාප්තියේ අසමානතා කෙරෙහි බලපාන භෞතික සාධක මොනවාද?
5. ආසියාවේ ජනාධික රටවල් 5 ක් හා අඩු ජන සංඛ්‍යාවක් වෙසෙන රටවල් 5 ක් නම් කරන්න.
6. ඔබ ඉහත සඳහන් කළ රටවල් ලෝක ආකෘති සිතියමක සේයාකර නම් කරන්න.
(5)